# අප්‍රකට පුස්කොළ පොත්වල සඳහන් පිරිත් බලයෙන් කෙම් ක්‍රම පිළිබඳ අධ්‍යයනයක්

වයි. කේ. තිස්ස බණ්ඩාර

## හැඳින්වීම

බෞද්ධ සමාජයේ විශේෂ අවස්ථාවල දී සජ්ඣායනා කරනු ලබන හා ශ්‍රවණය කරනු ලබන අගනා සූත්‍ර ධර්ම වෙසෙසක් වශයෙන් පිරිත් ධර්ම පිළිගැනුමට ලක්ව තිබේ. ථෙරවාදී බෞද්ධ රටවල පාලි භාෂා මාධ්‍යයෙන් සජ්ඣායනා කරනු ලබන පිරිත් දේශනා මාහැඟි ශාන්තිකර්ම සේ සැලකිය හැකිය. ශාරීරික, මානසික රෝග හා බහුවිධ උපද්‍රව දුරුකරනු වස් පිරිත් සූත්‍ර දේශනා කිරීම බුදුන්වහන්සේ ධරමාන සමයේ සිට පැවත එන්නේය. කෙම් ක්‍රම සඳහා පිරිත් භාවිත කැර ඇති බවට සාධක තිබේ. කෙම් යනු ක්ෂේමය, ආරක්ෂාව, රෝග නිවාරණාදිය සඳහා කරන ක්‍රියාවයි.

බුදුදහමට අයත් ගාථා තුළින් කෙම් ක්‍රම සිදුකිරීමට පෙලඹීම යන්ත්‍ර මන්ත්‍රවලින් ආරක්ෂාව පැතීම හා සමාන වෙයි. සාමාන්‍යයෙන් පිරිත් දේශනා කිරීම වරු පිරිත, සර්ව රාත්‍රික, තුන්තිස්පැය, සති ආදි වශයෙන් සිදුකරනු ලැබේ. ඒවාට අමතරව රහසිගත ලෙස පිරිත් කියා ආතුරයින් හෝ දේපළ ආරක්ෂා කළ ක්‍රමද අනාවරණය වෙයි. කට්ටඩිරාළ හෝ කපුමහතා මේ කයර්‍ය කරන්නට ඇත. කෙම් ක්‍රම සඳහා භාවිත කළ එබඳු පිටපතක එන තොරතුරු මෙයින් ප්‍රකාශ කැරේ.



## ක්‍රමවේදය

අදාළ පුස්කොළ පිටපත මූලික මූලාශ්‍රය සේ භාවිත කරනු ලැබේ. තවද, මුද්‍රණයෙන් ප්‍රකාශයට පත්ව ඇති ඒ හා සමාන හෝ ආසන්න සම්බන්ධයක් ඇති තොරතුරු මෙහි සන්දර්භය පෝෂණය කිරීම සඳහා පාදක කරගනු ලැබේ.

## අරමුණ

අභාවයට යමින් පවතින පුරාණ කෙම් ක්‍රම හා ආරක්ෂක විධික්‍රමවලට අයත් එක් කොටසක් මෙයින් එළි දැක්වීමත් බෞද්ධ ගාථා උපයෝගිකර ගනිමින් එබඳු සිරිත් නැවත ප්‍රචලිත කිරීමත් උදෙසාත් මෙය එළිදැක්වීම මෙහි මූලික අරමුණ වන්නේය.

## සාරාංශය

පිරිත් යන්නෙහි සිංහල අදහස ආරක්ෂාව, අන්තරාය වළකණු රතන සූත්‍රාදි ධර්මය වේ.[1] බුදුන්වහන්සේ විසින් වදාළ ආරක්ෂක දේශනාව පිරිත් ධර්ම නම්. මෙයට 'පරිත්ත' 'පරිත්‍රාණ' 'පිරිත්' යැයි කියනු ලැබේ. "පරිත්තං තු පරිත්‍රාණෙ පරිත්තො තිසු අප්පකෙ" යනු අභිධාන ශාස්ත්‍ර බැවින් පරිත්ත ශබ්දය පරිත්‍රාණාර්ථ අල්පාර්ථ දෙකෙහි වැටේ. මෙහි වනාහි පරිත්‍රාණාර්ථය වෙයි. මෙහි ලා පුරාතණිකයෝ "අන්තරයං පරිහරන්තං තායතීති පරිත්තං පරිතො වා සබ්බුපද්දවතො සත්තානං භයං උපද්දවං උපසග්ගං ච තායතීති පරිත්තං" යයි නිර්වචන දැක්වූහ.[2]

පෙළෙහි සඳහන් නැති සූත්‍ර, නිධාන කථා ආදිය අටුවාවෙහි සඳහන් වෙයි. ආනන්ද වනරතන හිමියන්ගේ ශිෂ්‍ය හිමිනමක් විසින් සංග්‍රහ කරනු ලැබ ඇති අටුවාව මේ අතරින් සුවිශේෂ වන්නේ ය. එය සාරත්‍ථසමුච්චය නම් වෙයි[3]. වැලිවිට සරණංකර

1 ශ්‍රී සුමංල ශබ්දකෝෂය, සම්පාදක. වැලිවිටියේ සෝරත හිමි. (1999) එස්. ගොඩගේ, කොළඹ, පි. 610.

2 පාළි - සිංහල පිරිත් පොත, සම්පාදක කිරිවත්තුඩුවේ ධර්මකිර්ති ශ්‍රී ප්‍රඥාසාර හිමි. (2002) එස්. ගොඩගේ, කොළඹ, පි. 31.

3 සාරත්‍ථසමුච්චය නාමා චතුභාණවාරට්ඨකථා, සම්පාදක දොරණාගොඩ ඤාණසේන හිමි, (1929) හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ.

සංඝරාජයන්වහන්සේගේ කෘතියක් වන සාරාර්ථදීපනි හෙවත් සතර බණවර සන්නය පිරිත් සම්බන්ධයෙන් වැදගත් සන්න පොතක් වන්නේ ය.[4] බුද්ධඝෝෂ හිමියන්ගේ කෘතියක් වූ පරමත්ථජෝතිකාවෙහි මංගල, රතන, මෙත්ත සූත්‍රවල වර්ණනාව අන්තර්ගත වෙයි.[5]

පිරිත් සම්බන්ධයෙන් රිස් ඩේවිස් මැතිණිය මෙසේ සඳහන්කර තිබේ.

"පිරිත් සජ්ඣායනයෙන් නැගෙන නාදය විනිවිද යන ක්‍රියාකාරී බලවේගයන් සේ සැලකේ. යහපත් අදහස්වල ශක්තිය ශබ්ද තරංග සමඟ මුසුවී බොහෝ ඈත සිටින සත්ත්වයන් වෙතද විකාශනය වෙයි. පිරිතෙහි ළයාන්විත නාදය ස්නායු පද්ධතිය පිනවීමට ද රුධිරයේ පවිත්‍රත්වයටද මානසික සංහිඳියාව ඇතිවීමටද හේතුවන බැවින් මානසික මෙන්ම ශාරීරික සුවයද දනවති' යි සැලකිය හැකිය."[6] යනු යි.

ලංකාවේ සම්ප්‍රදායික දැනුම සහ ජනශ්‍රැතිය පිළිබඳ පර්යේෂණ සිදුකළ පියසේන කහඳගමගේ මහතා කෙම් ක්‍රම පිළිබඳව පුළුල් ලෙස විස්තර සපයා ඇත. ඔහු 'කෙම්පහන්' නමින් කෘතියක්ද පළකොට තිබේ. එහි සඳහන් කෙම් ක්‍රම ප්‍රධාන ලෙස කොටස් පහළොවකට වෙන්ව ඇත. ඉන් අභිචාර විධි මත පදනම් වූ කෙම් ක්‍රම පිළිබඳව මෙසේ ගම්‍යවනු ඇත.

"අභිචාර යන වදනට අර්ථ නිරූපණය කරන පූජ්‍ය පණ්ඩිත වැලිවිටියේ සෝරත හිමියෝ 'කොඩිවින කිරීම' යන තේරුම ඉදිරිපත් කරති. එහෙත් වර්තමානයේ මෙම වචනය තොවිල් පවිල් යන්ත්‍ර මන්ත්‍ර හදි හූනියම් අනවින කොඩිවින බලියාග සෙත් ශාන්ති ආදි වශයෙන් පැතිරී ඇති ගුප්ත විද්‍යා සීමාව ම ආවරණය කිරීමට යොදනු දැකිය හැකි ය. එහෙයින් මෙහිදී අභිචාර විධි යන

4 සාරාර්ථදීපනි සතර බණවර සන්නය, සංස්කරණය අත්තුඩාවේ සිරි රාහුල හිමි. (2000) සමයවර්ධන සමාගම, මරදාන.

5 පරමත්ථජෝතිකා නම් වූ ඛුද්දකපාඨට්ඨකථා. සිංහල පරි. මැදඋයන්ගොඩ විජයකිත්ති හිමි (2009) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. නැදිමාල.

6 පිරුවානා පොත්වහන්සේ, සම්පාදක, අත්තුඩාවේ රාහුල හිමි, (1994) සමයවර්ධන සමාගම, මරදාන, පිටුව. පෙරවදන, පි. xviii.



වචනය භාවිත කරන්නේ සෝරත හිමියන් ගේ අර්ථ නිරූපණයට වඩා පළල් සීමාවක සිට 'ගුප්ත විද්‍යාවන්' යන අදහස මතුවන පරිදි ය.

කෙම් ක්‍රම සැලකිල්ලට ලක් කරන විට පෙනී යන ප්‍රධාන කාරණයක් වන්නේ වැඩි ප්‍රමාණයක විද්‍යාත්මක පදනමක් ඇති බව ය. පදනමක් ඇති උපායකින් පලිබෝධ නාශක කටයුත්ත කෙරෙන කෙම් ක්‍රම පෙර සාකච්ඡා කෙළේ එවැනි කෙම් ක්‍රම ගැන ය. මන්තර සම්බන්ධ වුව ද උපායන් හඳුනාගත හැකි කෙම් ක්‍රම ද ඉහත කී ගණයේ ලා සැලැකුණු බව ඔබ දන්නෙහි ය.

අප රැස්කර ගත් කෙම් ක්‍රම අතර උපායන් හඳුනාගත නොහැකි අභිචාර විධි මතම පදනම් වූයේ යයි සිතිය හැකි කෙම් ක්‍රම රාශියක් ද ඇත. ඒවා ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය.

I. යන්ත්‍ර

II. මන්ත්‍ර

යනුවෙන් අපි ඒවා සරල ලෙස වර්ග කර ගනිමු. විවිධ යන්ත්‍ර අඳින ලද තඹපත් හෝ තල්පත් එල්ලීම යන්ත්‍ර ගණයේ ලා සැලකිය හැකි ය. බොහෝ විට යන්ත්‍ර (එල්ලීමට පෙර මැතිරීම් ද කෙරිණි. සීවලී යන්ත්‍රය, රතන යන්ත්‍ර, නවග්‍රහ යන්ත්‍රය. අ. ඉ. උ. එ. ඔ. ශ්‍රී යන අක්ෂර එකතු කොට නිර්මාණය කළ ස්වර බන්ධනය ආදී වශයෙන් වූ යන්ත්‍ර රාශියක් භාවිත වූ බව කියැවෙන නමුත් ඒවා දත් පිරිස ඉතා අඩුය. මේ නිසා අපට සොයාගත හැකි වූයේ යන්ත්‍ර දෙකක් පමණි. ඒවා උපග්‍රන්ථයේ ඇතුළත් ව ඇත. මන්තර ද වර්ග දෙකක් හඳුනා ගත හැකිය. කෙම් ක්‍රම හා වැඩියෙන් පිරිත් බණ්ඩ හා ගාථා ය. රතන සූත්‍රය, කරණීයමෙත්ත සූත්‍රය, හා ජලනන්දන පිරිත වැඩි වශයෙන් භාවිත පිරිත් බණ්ඩ ලෙසින් හැඳින්වීම යුක්ති සහගතය. "සබ්බපාපස්ස අකරණං..." ගාථාව "ඉතිපිසෝ ...." ගාථාව සහ ජයමංගල ගාථා ප්‍රධාන තැනක් ගත් බුද්ධ මන්තර ලෙස සැලකිය හැකිය.

මැස්සන්ගෙන් සිදුවන හානි වැළැක්වීම සඳහා ගොයම් පීදෙන අවස්ථාවේ "යථීන්දබීලෝ..." නම් ගාථාව ලියා එල්ලා

තබති. එවිට මැස්සන්ගෙන් හා කුරුල්ලන්ගෙන් සිදු වන හානි වැළකේයයි විශ්වාස කරති.

මැසි හා පණු උවදුර වැළැක්වීමට තඹ ඉරුවක හෝ තල පතක සීවලී දැහැන ලියා රාත්‍රියක එල්ලීමට ගොවීහු පුරුදු ව සිටිති. බුද්ධ මන්තරයකින් සීවලී දැහැන 108 වතරක් ජීවම් කළ යුතුයයි විශ්වාස කරන්නෝ ද වෙති. මෙම කෙම කළ පසු කුඹුරට පිවිසෙන පාර අසල බුවල්ලක් (හනස්සක්) සිටුවා ආපසු නො බලා පිටවී ගොස් තුන් දිනක් කුඹුරට ඒමෙන් වැළකී සිටිය යුතු ය. බූවල්ල හිටුවීමෙන් කුඹුරට පිවිසීමට තහංචි පනවා ඇති බව සන්නිවේදන කෙරේ.

රතන සූත්‍රයේ පළමු වැනි යන්ත්‍රය ඇඳ "වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ ගිම්හානමාසෙ පඨමස්මිං ගිම්හෙ තථූපමං ධම්මවරං අදේසයි නිබ්බානගාමිං පරමං හිතාය ඉදම්පි බුද්ධෙ රතනං පණීතං ඒතේන සච්චේන සුවත්ථි හෝතු" යන ගාථාවෙන් 108 වරක් මතුරා කුඹුරේ තැන් තැන්වල එල්ලා තබති. වී අටුවලට ද මේ කෙම කරනුයේ මැසි උවදුර වළක්වා ගැනීමට ය.

මෛත්‍රී සහගතව රතන යන්ත්‍රය ඇඳ එම යන්ත්‍රය ඉහත සඳහන් ගාථාවෙන් 108 වරක් ජෙ කර කුඹුරේ තැන් තැන්වල එල්ලා තැබිය යුතු ය. මස්, මාළු, කරවල, බිත්තර වැනි පිලී ආහාර ගෙන කුඹුරට යාමෙන් වැළකී සිටිය යුතු ය."[7]

ම විසින් හඳුනාගනු ලැබූ එක්තරා පුස්කොළ පිටපතක් ඇසුරෙන් පිරිත් බලයෙන් විවිධ කෙම් ක්‍රම හා අභිචාර විධි පැවැත්වූ බවක් පෙන්නුම් කරයි. 'පිරිත් සන්නය' නම් එකී පුස්කොළ පිටපත පාරම්පරිකව පැරණි පිටපතකි. එහි අන්තර්ගත කරුණු විවිධ කෙම් ක්‍රම සඳහා පුරාතනයේ දි භාවිත ව පැවති බව පැහැදිලි ය. එකී පිටපතේ රතන සූත්‍රය, මෙත්ත සූත්‍රය, ධජග්ග සූත්‍රය යන සූත්‍ර අනුසාරයෙන් කෙම් ක්‍රම පෙන්නුම් කරනු ලබයි. ඒවාගේ උපයෝගිතා මෙසේ ය.


7 කෙතක මහිම, කෙම් පහන්, පියසේන කහඳගමගේ. (1995) එස්. ගොඩගේ, කොළඹ.





සියලු කාරියට, අලියාට, වලහාට, අංගම් හූනියන් නොවැදීමට, අනවින හූනියන් නොවැදීමට, ආරක්ෂාවට, ඇතාට, ඇස්වහ කටවහට, යක්ෂ භයට, කිඹුලන්ට, දරුවන්ට බත් කැවීමට, දරුවන් බිහි කිරීමට, නුවන වැඩිවීමට, ආයුෂ වැඩිවීමට, පොල් පුවක් සිටුවීමට, බාලයන්ට රූකිරි කටගෑමට, භය දුරුවීමට, ගැබ් පිහිටීමට, රජුන් මහතුන් දැකීමට, වඩු කර්මාන්තයට, වදන්ට බැරි අයට, වී බෝ වීමට, ශ්‍රියාව ඇතිවීමට, සර්පභයට" භෝග ආරක්ෂාවට, සතුරෝ ඇති නො වීමට, හී නොවැදීමට, ආරක්ෂාවට, වාදයෙන් දිනීමට ආදි කරුණු වෙනුවෙන් ය.


ගුරුකම්, යන්ත්‍ර, මන්ත්‍ර ආදිය අප සමාජය කෙරෙන් බැහැර නො වන්නා වූත් බැහැර නො කළ යුතු වූ ත් පුරාණයේ සිට පිළිගනු ලබන කිසියම් විශ්වාස අංගයකි. මන්ත්‍ර ගුරුකම් පිළිබඳ ව ජනශ්‍රැතියේ එන බොහෝ දෑ කටවහරින් පැවතීමත් රහසිගත ව පවත්වාගෙන යාමත් අනුව වර්තමානය වනවිට බොහෝ ගුරුකම්, කෙම් ක්‍රම, යන්ත්‍ර මන්ත්‍ර අභාවයට යමින් පවති. එහෙත් ජන විශ්වාසය අභාවයට යෑමක් දක්නට නොමැත. යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් කරනු ලබන අය අන් අයට නො තේරෙන සහ නො ඇසෙන ලෙස කියවනු ලබන බොහෝ දෑ මොනවාදැයි නො තේරෙයි. එ බඳු යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම්, ශාන්ති කර්ම ආදිය සඳහා පිරිත් සූත්‍ර අනුසාරයෙන් තොරගනු ලැබ ඇති ගාථා ප්‍රමාණයක් අප විසින් හඳුන්වා දෙනු ලබන පිටපතේ අන්තර්ගත වේ.

එම පිටපතේ පත්ඉරු ඡායාපිටපත් (උපග්‍රන්ථයෙහි) දැක්වෙයි.

















එකී පිටපතෙහි පොදු විස්තරය මෙසේ ය.

| | | |
|---|---|---|
| අයිතිය | - | අස්ගිරිය මුල්ලේගම පන්සල |
| පත් ඉරු | - | දහතුනයි |
| අංකනය | - | 1 - 2 ක්‍රමයට |
| පත් ඉරුවක දිග | - | අඟල් අටයි |
| පත්ඉරුවක පළල | - | අඟල් දෙකයි |
| අඟලකට අකුරු | - | හත අට ප්‍රමාණය |
| අන්තර්ගතය | - | තුන් සූත්‍රයේ ගාථා සහ තවත් ගාථාවලින් ලැබිය හැකි ආරක්ෂා විධික්‍රම සහ කෙම් ක්‍රම |
| අවසානය | - | පිරිත් සන්නයයි - සිඬිරස්තු - සුහමස්තු ආරෝග්‍යමස්තු - යනුවෙන් ලියා තිබේ. |
| භාෂා විලාසය | - | මෙම පිටපතේ සිංහල ලේඛනයේ විශේෂ වදන් කීපයක් තිබිණ. ඒවා මෙසේ ය. ඉදිරියෙන් ඇත්තේ ම විසින් දෙනු ලබන අර්ථයන් ය. |

| | | |
|---|---|---|
| අකුරක් | - | ගල් කැටයක් |
| අකරු සතක් | - | ගල් කැට සතක් |
| අටතුරාසියක් | - | එකසිය අටවරක් |
| අරක්ගල | - | පාගන ගොයමට යටින් කමතේ මුලින් තබන දෙයක් |
| ඔපස් | - | ඔසප් |
| කතුරෝ | - | කාවෝ |
| කාඩි ශැලියක් | - | හාල්පානු වතුර හැලිය |
| කෝඩු බිම් | - | නව ගොවිබිම් |
| නෙරලු දිය | - | පොල් වතුර |
| ලකවැල | - | නවගුණවැල. |



මෙහි ඇති සෙසු වචන සිංහල හා පාලි භාෂාවේ ව්‍යවහාර ක්‍රමයට එයි. එහෙත් හල් කිරීම් පද බෙදීම් අකුරු ගැළපීම් එතරම් පිළිවෙළකට නැත. අකුරු කියවිය හැකි ය. (පිටපතට ඇතුළත්ව තිබූ දැනට නැති පත් ඉරු දෙකකි. එනම් දෙවන පත් ඉරුව සහ දහතුන්වන පත්ඉරුවයි).

මේ පිටපතින් දක්වනු ලබන පිරිත් සූත්‍ර ගාථා කියවා එයට දී ඇති උපදෙස් පිළිපැදීමෙන් සෙතක් ශාන්තියක් ලබන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස...!

යානිධ භූතානි සමාගතානී........

තස්මාහි භූතා නිසාමේථ සබ්බේ......

මේ ගාථා දෙක ජප කරන කල පිරිසිදු වස්ත්‍රයක් ඇඳ සඟනට කිරිබත් දන් දී යහපත් පිළිම ගෙයක කිරිබත් පුදා ගිතෙලින් පහන් පුදා දුම්මල පුදා මා සිතුවායි සිද්ධ වෙවයි කියා බුදුන්ට ආරාධනා කොට ලකවැලක් අතට ගෙන අටතුරාසියක් පුරවනු. සියලු කාරියට යහපොති.

**යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා........**

යන ගාථාවෙහි අභිප්‍රාවනන් යක්ෂයින්ට තෙල් නූල් මතුරනු යක්ෂ මූර්චාවට යක්ෂ උපද්‍රවයට යහපති. බාලයින්ට මතුරනු කොළ මැඩවීමට ගල් හතරක් මතුරා ගාථාව ලියා වාරිය කන්දේ හතර කොන වළලනු අරක්ගලට දපා එසේම කරනු කොලපල්ල නුඟුලුවා මඩවනු යක්කු වි නොගනිත් තව ද මෙම ගය බුදුනට විළඳ වට සඟනට කිරිබත් දන් දී අටතුරාසියක් දපනු හැමට වැඩ සිද්ධ වෙයි. ඔයින් මුහුදින් හෝ වැලිගෙන මෙම ගයින් අටතුරාසියක් පුරවා තමා වසන ගෙයි පිටිහේනේ දමනු යක්කු නොවදිත්, භය දුරුවෙයි. යම් භයක් ඇතිව ගමනක් යන කල තුං පුරුක් තියෙන ඊතණ ගහක් කඩාගෙන ඊට අටතුරාසියක් මතුරා හිස පැළඳ මග කිය කියා යනු භය දුරුවෙයි. මෙම ගයින් ආයුෂ බෝවෙයි. මෙම ගය ඔපස් ගත් දා රෑ මතුරා වතුර පොවනු දරුවෝ සිටිත්, මෙ ගය සපුමලට මතුර වී අටුයේ තබනු වී බෝවෙයි. පිලි පෙට්ටියේ තබනු පිලි වැඩි වෙයි. සත්විටක් කුජ

දින සවස පේ කොට බුද දින උදය අටතුරාසියයක් මතුරා පිලි පෙට්ටියේ තබනු කතුරෝ නොකත්, මෙම ගය සිහිකොට ගොස් අනුන් හා යුක්ති බනනු යහපොති

**යේ පුග්ගලා අට්ඨ සතං පසත්ථා.....**

යන ගාථාව අතට මතුරා ඇඟ අතගානු ශ්‍රියා ඇති වෙයි සියලු භය දුරුවෙයි. සිහි කරනු සතුරෝ මිතුරෝ වෙත් තමා ආශ්‍රය කරෙන් සටනට යනු දිනත් සිහිකරනු. සර්ප උපද්‍රව නොවෙයි. සර්පයින් කෑ විට තල් වැටට මතුර ඇඟට සලනු විස හැරෙයි. සත් විටත් මතුරා පිස දමනු විස බසියි. අටතුරාසියක් පිරුව රුජා හැරෙයි. මෙම ගය සශ්‍ය ඵල ආදී සියළු භෝග වලට අටතුරාසියක් දපා වපුරනු. සියලු පනු උපද්‍රා නැතිවෙයි

**යේ සුප්පයුත්තා මනසා දළ්හේන...**

යන ගාථාව තමා යන කළ දෑ සල නො කරනු කැමති, සාල් ගැරු තැනින් අකුරු සතක් ගෙන එකකට සත් විටක් මතුර ගෙයි සතර කොන ද ගෙමැද්ද මැද ද ඉස්දොර පාමුල තබනු, තමා කළ දෑ ශැක නො වෙයි. අනුන් හා යුක්ති බනන කල කාඩි ශැලිය තිබූ තැනින් අකුරක් ගෙන සුවඳ පැනින් නාවා මතුර දුමෙහි තබනු දකුණු පය පෙරට තබා යනු දිනත්, කුරුම්ණියන් කෑ පතක් කළුවර දා පේ කොට තමා ආයුධ ගන්නා කල ඉං පතක් කපා ඊට අටතුරාසියක් මතුරා පුරවා සටනට යනු, යන කල එකක් ඉස තබා යනු, ශර ඇඟ නො ගනී. මීට ශක නොකරනු මෙම ගය අටතුරාසියක් අතට මතුරා දිවුරුමට යනු දිනත් සියලු දේට යහපති

**යථින්ද ඛීලෝ පඨවිංසිතෝ සියා...**

යන ගාථාව නො ඉදුල් තෙලට අටතුරාසියක් මතුරා පහන් අවුල්ලා ගෙට ගන්නා බිම බලා සිටිය යහපති වට බලා සිටිය නපුරු උඩ බලා සිටිය තුං මංසලින් නාළු වෙයි. මෙම ගය සමන් මලට අටතුරාසියක් මතුර මහ සෑයක හෝ මහ බෝධියක හෝ පිදුව දෙවියෝ අරගනිති. සර්ප බය නොවයි. තමා කැමති දේ සිද්ධ



වෙයි. රුජා පහරන තැන තෙලට පිරිත් කොට රුජා ඉස්තානේ ගානු. රුජා නැතිවෙයි. පිරිත් කොට පමණින් සතුරෝ නො වෙත්

**යේ අරියසච්චානි විභාවයන්ති...**

යන ගාථාව අනුන් විසින් භයක් ඇතිනං එක්ව පුරවනු, හතුරු භය දුරුවෙයි. මෙම ගයින් තෙල් හදුං මතු ඇඟ ගානු, ශ්‍රියා ඇති වෙයි. සර්ප භය අග්නි භය යක්ෂ භය ආදී වූ සියලු භය නසන්නේ ය. මෙම ගයින් තමා උගහයක් ඇතිනං එක්වන් ඇත්නම් ගොරද හෝ සඳුන් හෝ ගෙන අටතුරාසියක් මතුර මෙම ගය සඳහන් කොට මහා සෑයෙහි දි වෙර පසඟුල් දෙත්, අනුන් කළ දෙය නොව තමා හට ජය ඇතිවෙයි. යහපති

**සභාවස්සන දස්සනසම්පදාය...**

යන ගාථාව තෙලට අටොරාසියක් මතුර බුදුන්ට පහන් පුදා සඟනට කිරිබත් දන් දී මා සිතූ දේ සිද්ධ වෙවයි කියා තැඹිලි ගහට පිට ලා අටොරාසියක් මතුර ගසින් මලක් පලදිනු. ශර ඇඟ නොගනී. මෙම ගය කිය කියා සතුරා කරා යනු ශර ඇඟ නො ගනිත් තමට ජය වෙයි. අනුන් තමා එක් වන් කේලාම් කියත් නම් රත් හඳුන් හෝ ගොරද හෝ ගෙන අටතුරාසියක් මතුරා තමා සිතුදේ සිද්ධ වෙවයි සිතා මහා සෑයේ පුදනු මෙම ගය පැනට අටතුරාසියක් මතුර ගෙට හෝ මඩුවට ඉසිනු. බලු මැක්කන්නට යහපති

**කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං...**

යන ගාථාව පස්වතක් බත් වෙන වෙනම පිඬු කොට එලවරාපත් පිට තබනු හතුරෝ ඇස නො පෙනෙයි. එම පත් දකුණතින් බිජුවට අල්ලා මෙයින් පිරිත් කොට බිජු වපුරනු සතුන් විසින් උපද්‍රව නොවෙයි. මෙම ගය කියා කුඹුරේ සීසාන කල පිරිත් බනනු ඌරෝ නොකත්, සොරුන් විසින් උපද්‍රව නොවයි. මෙම ගය කියා සුදෙන් බෙර ඇස ලියා වපුල වියේ නම කියා කුඹුරේ නම කියා වපුල ඇසුනු මානේ මැස්සෝ නො කත්, එම දවස්

පනිවාදී වූ පවු නො කරනු රතක් ඇඳ පොරවා රතක් ඉසවසා බැඳ රතකිං බෙරය වසා මෙම කුඹුර පසක මිනිසුන් නො දක්නා තැනක ලගිනු පොටක ගැටලා කිඹුලො ඇති තැනින් යනු. මෙම ගයින් එකසිය අටවරක් කොට ඒ පිරිත් පැන් නා සබයට යනු යහපති ෴

**වනප්ප ගුම්බේ යථා ඵුප්පිතග්ගේ...**

යන ගාථාවෙන් බිපු වපුරනු පැනට දපා ගෙයි ඉසිනු විවාහ ගන්නෝ මෙම ගාථාවෙන් අටතුරාසියක් තෙලට මතුරා පාන් දල්වනු පාන් දළුව බිමට නැමුනු සලකුනෙන් ගෙවල් නඟනු මෙයින් පැනට අටොරාසියක් මතුර ප්‍රසව නො හෙන්නාට පොවනු. ප්‍රසව වෙත්. මෙයින් තෙල් හඳුන් පිරිත් කොට ඇඟ ගානු. ශ්‍රියා ඇති වෙයි. බුදුන් මාර පරාජය කොට සේ හිතා වැද කොටනු. ආයුධ ගන්නා වේලේ මෙම ගය සිහි කරනු ජයවෙයි. මෙ ගයින් සඳුං මතුර පිලියේ අර්ධ චන්ද්‍රයා ඇඟ වතිං පානු. සතුරං ඇකිලේ කුස දරුවන් ඇති ස්ත්‍රීන්ට මෙම ගයින් පිරිත් කොට පැන් නාවනු. දුක් අන්තරා නැති වෙයි. අතට මතුර ගෙඩි පිස දමනු. විකායෙයි. සමන් මලට මතුර අසල රජුන් ආදීන් දකිනු යහපති ෴

ශැක නො කරනු. උළුවහු පැනීමට වැව් පස් දැමීමට පිං තාලි හැදීමට වඩු කර්මාන්තයට සියලුම දේට යහපති ෴

**වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ...**

යන ගාථාවෙන් පැනට මතුරා ගෙයි ඉසිනු. පිලි ලැබෙයි. වී කොටන ගේ ලගින ඉපියන්ගෙන් මීයන්ගෙන් උපද්‍රව නැති වෙයි. මතුරා ඉහිනු ගහ කරල යහපත් වෙයි. මෙම ගය කිඹුල්ලන්ට යහපති ෴

**ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං...**

යන ගාථාව කියා අඳින පිලියට මතුර උර මාලයටත් මතුර පළඳිනු තල තෙලේ මතුර ඇඟ ගානු සියුළු උපද්දා නැතිවෙයි. අනවින නොවදි. මෙම ගයින් පැනට මතුරා ඉසිනු මල් භය



දුරුවෙයි. කිරිහරකටත් ඉසිනු. යහපති. මෙම ගයින් පැං මතුර ඉසිනු සියළු උපද්‍රා නැති වෙයි. හරක් ගාලට ලනු වී කොටන ගෙයි ලනු වී බෝ වෙයි ෴

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්ලික්ඛේ
තථාගතං දේවමනුස්සපූජිතං
බුද්ධං නමස්සාමි සුවත්ථි හෝතු
යානිධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්නීක්ඛේ
තථාගතං දේව මනුස්ස පූජිතං
ධම්මං නමස්සාමි සුවත්ථි හෝතු
යානිධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්ලික්ඛේ
තථාගතං දේව මනුස්ස පූජිතං
සංඝං නමස්සාමි සුවත්ථි හෝතු

යන ගාථා තුන කියා කුඩා දරුවාට නාවනු මෙම වතුරට ඉසිනු. ගල් මතුරා වලලනු යක්ෂ ආරක්ෂාවයි. මෙම ගය කියා රජගෙට යනු ප්‍රධානියන් කරා යන විට දකුණු පය ඉදිරි කොට යනු ජය ඇති වෙයි සමන් මලට මතුර ඉස තබා ගොස් ඇමතියන් දකිනු ෴

෴ රතන සූත්‍රයයි..

**තස්මාහි භූතා නිසාමේථ සබ්බේ...**

යන ගාථාව රජුං මහතුං දකින්ඩ තෙල් මතුරා ගානු ශ්‍රීයාවටය ෴

**සබ්බපාපස්ස අකරණං...**

යන ගාථාව ඇතාට අලියට තුං තුං විට මතුරනු අලීයට ගල් වලලනු අද්දුටුවයි. සත්තයි ෴

**යථොහං භගිනි ආරියාය...**

යන ගාථාව වදන්ට බැරි අයට ඔප තෙල් අට වරක් මතුරා දෙනු බිහිවෙයි. සත්තයි ෴

**පරිත්තං යං භණන්තස්ස...**

යන ගාථාව තෙලට දපා නානු වඩනු දරු බිහිවෙයි සත්තයි ෴

**අභිවාදන සීලිස්ස...**

යන ගාථාව දරු බත් කැවීමට අට වරක් මතුර දෙනු ආයු බල වැඩිවීමට ද නිරෝගි වීමට ද නුවන වැඩිවීමට ද යහපති ෴

**සබ්බීතියෝ විවජ්ජන්තු...**

යන ගාථාව බාලයන්ට රංකිරි මතුරා දෙනු. ආයු වඩයි. නුවන වඩයි. විජ්ජාව ධාරනයි. යහපති ෴

**කරණීයමත්ථකුසලේන...**

යන ගාථාවෙන් තෙලට අට වරක් මතුරා තිලක ලා යනු රජුං මහතුං දැකීමට යහපති ෴

**සන්තුස්සකෝ ච සුභරෝච...**

යන ගාථාව අවුරුදු කෝනය ද සමන්මල් තුන් සීයක් ගෙන අට වරක් මතුර වළඳනු ආයුස නුවන වැඩීමට යහපති ෴

**නච කුද්දං සමාචරේ කිඤ්චි...**

යන ගාථාව කිඹුලාට මතුරනු යහපති ෴

**යේ කේචි පාණභූතත්ථි...**

යන ගාථාව අලියාට වලහාට මතුරනු සත්තයි ෴



**දිට්ඨා වා යේව අද්දිට්ඨා...**

යන ගාථාව අටතුරාසියක් දපා කොල මිරිකනු. අවුවට වී දමනු අළුත් ගෙවල් වලට ගෙවදිනු ෴

**න පරෝ පරං නිකුබ්බෙථ...**

යන ගාථාව නෙරළු තෙලට දපා ගසනු අංගමෙන් මලෝ උපදිත්, අංගං, සූනියං, නො වදී ෴

**මාතා යථා නියං පුත්තං...**

යන ගාථාව කෝඩුබිම් ගෙවදීමට වතුර ගෙවදීමට ගෙවල් තැනීමට අළු සහල් කැමට සියළු වඩු කර්මාන්තයට වස් නැත. යහපති ෴

**මෙත්තං ච සබ්බලෝකස්මිං...**

යන ගාථාව සිහිකොට පොල් පුවක් යන ඵල සඳනු යහපති ෴

**තිට්ඨං චරං නිසින්නො වා...**

යන ගාථාව යක්ෂ උපද්දා ඇති ගෙදරට විස්සක් ගල් පේ කොට අටතුරාසියක් මතුර ගෙයි ඉද්දර එකක් වලලනු. එලිපත්තේ මුල එකක් වළලනු දොරකඩ මිදුල මැද එකක් වලලණු ගේ වට සතරක් වලලනු. කන්කඩ ඉමේ සතරක් වලලණු. මෙම ක්‍රම නාමයෙන් දපා වලලණු පිල්ලං අංගං බැඳ එවා හූනියන් යකුන් ආපසු නො බලා යත් බුද්ධ වචනේ සත්තයි. තමාට කිසි භයක් නොවදී ෴

**විරූපක්ඛෙහි මේ මෙත්තං...**

යන ගාථාව අටතුරාසියක් දපා අරක්ගල තබනු කමත වට ගල් සතරක් දපා කමකට සලකනු පැං දපා ඉසිනු පුසුව කොල හෙලා මිරිකනු යකුන් වී නො ගනිත්. වී බෝ වෙයි. යහපති බුද්ධ වචනේ සත්ථයි ෴

**සබ්බේ සත්තා සබ්බේ පානා...**

යන ගාථාව ක්‍රෝධයන්ට බුලත් බන්දයෙන් ස්ත්‍රීන්ට ගිතෙල් හෝ පැන් හෝ නෙරළු දිය හෝ මේ වට අටතුරිසයක් දපා දෙනු ෴

**ඒවං මේ සුතං ඒකං සමං භගවා සාවත්තියං විහරති...**

යන ගාථාව ඌර මුවං දකින්ඩ යහපති. තෙල් දපා මූණ දමනු ශ්‍රිවාවටයි ෴

සචේ මාරිසා සේවං සංගාම ගතානං උප්පජේය්‍ය භයං වා...

යන ගාථාව අනවින හදි හූදියන් නො වදී. යහපති ෴

**නො චේ මේ ධජග්ගං උල්ලෝකෙය්‍යාත, අථ පජාපතිස්ස...**

යන ගාථාව අනවින හදි හූදියන් නො වදී යහපති ෴

**නො චේ පජාපතිස්ස දේව රාජස්ස ධජග්ගං...**

යන ගාථාව ඇස්වහ කටවහට තෙල් මතුරනු ෴

**නෝ චේ වරුණස්ස දේව රාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ...**

යන ගාථාව තෙල් හඳුන් දපා තිලක ලනු අනවින හූනියං නො වදී යහපති ෴

**නෝ චේ වරුණස්ස දේව රාජස්ස ධජග්ගජ උල්ලෝකෙය්‍යාථ...**

යන ගාථාව අදිනා පළඳිනා ආභරණට මතුරණු අන වින යක්ෂ උවදුරු දුරුවෙයි ෴

**තං ඛෝ පන භික්ඛවේ සක්කස්ස වා දේවානමින්දස්ස...**

යන ගාථාව යක්ෂයාට වැසි මුගුරුත්තාවට ඉස අල්ලා සත් විටක් දපනු. යක්කු පසුස නොබලා දුවත් තෙල් නූල් දපා බඳිනු. යහපති ෴ පිරිත් සන්නයයි ෴ ආරෝග්‍යා මස්තු ෴



පරිත - පරිත්ත - පිරිත යන්නෙන් සකස් වී ඇති මේ වචනයෙන් අදහස් වන්නේ මනෝවිද්‍යාත්මක ආරක්ෂාවකි. යන්න පූජ්‍ය මාපලගම මෙත්තෙය්‍ය හිමිගේ 'පිරිතේ බලය හා ගත හැකි ප්‍රයෝජන' නැමැති කෘතියේ පෙරවදනෙහි සඳහන් වෙයි. එහි මෙසේ ද සඳහන් වෙයි. "දසදහසක් සක්වල ආඥා චක්‍රය පවත්නා පිරිත් සූත්‍ර පහක් පිරුවානා පොත් වහන්සේගේ සඳහන් වෙයි.

1. විශාලා මහනුවර තුන්බිය දුරුකිරීමට දේශනා කළ රතන සූත්‍රය
2. පෙර බුදුවරුන්ට නමස්කාර කොට ආහාර සෙවීමෙහි නිරත මොණරෙක් පිළිබඳ සඳහන් මෝර පිරිත
3. රාහු විසින් චන්ද්‍රයා බුදුගුණ සිහිකිරීමෙන් කළ නමස්කාරය සඳහන් චන්ද පිරිත
4. ධජාග්‍රය බලා බිය දුරුකර ගන්නවාට වඩා වීතරාග - වීතදෝෂ - වීත මෝහ ගුණාංගයන්ගෙන් යුතු රත්නත්‍රය දෙස බැලීම වැදගත් බව සඳහන් ධජග්ග පිරිත
5. සිවුවනක් පිරිසට අමනුෂ්‍යයන්ගෙන් පැමිණෙන උවදුරු වළක්වා ගැනීමට වෛශ්‍රවණ විසින් බුදුරදුන්ට පැවසූවේයැයි කියනු ආටානාටික පිරිත" යනුයි.

ඒ එසේ වූව ද කරණීයමෙත්ත සූත්‍රය ද තවත් සූත්‍ර කීපයක් ද බහුවිධ ආරක්ෂාවක් සම්බන්ධයෙන් පුරාතනයේ සිට භාවිතව ඇති බව පැහැදිලි වෙයි. ඓහලෞකික හා පාරලෞකික යන උභයාර්ථ සිද්ධිය උදෙසා පිරිත් භාවිත කිරීම බෞද්ධ ප්‍රජාවේ සිරිතකි. ශබ්ද විද්‍යාවට අනුව පිරිත් කීමේ දී මුඛයෙන් පිටවන ශබ්ද තරංග හෙවත් ශබ්ද ශක්තිය ඉතා වැදගත් වේ අක්ෂර, සණ, මාත්‍රාවලට අනුව නිවැරදිව උච්චාරණය කිරීම හේතුකොට ගෙන ශක්තියක් හෙවත් බලයක් උත්පාදනය වේ. එමගින් ශ්‍රාවකයාගේ හෘදය ස්පන්දනය ආදී කොට ඇති කායික ක්‍රියාකාරිත්වත්, මානසික ක්‍රියාකාරිත්වයත් තුළ වෙනසක් සිදුකළ හැකිය. එය පුද්ගලයාගේ යහපත පිණිස පවතී. මානසික සිතිවිලිවලට දේශකයන් වහන්සේගේ කරුණාව, මෛත්‍රිය හා ශබ්ද තරංගවල සත්‍යය මිශ්‍රවීම නිසා ශ්‍රාවකයාට විශිෂ්ට ප්‍රතිඵල පැන් හා නූල් මගින් ද වැලි හා ගල් යොදා ගැන්මෙහි ද ඈත අතීතයේ සිට

බෞද්ධයන් පුරුදුව සිටින්නේ පිරිතෙන් සාර්ථක ප්‍රතිඵල ලබා ගැන්මට ය.

පුස්කොළ පිටපත් සමීක්ෂණයේ යෙදුණු අවස්ථාවක දී මෙම ලියුම්කරුට ඉහත දක්වන ලද පිරිත් සන්නය පිටපත හමුවිය. කුඩා පිටපතක් වූ මෙහි ඇත්තේ තුන් සූත්‍රයට අයත් රතන සූත්‍රයේ ගාථා සහ තවත් පිරිත් පාඨ කිපයකි. මෙම පිටපතේ උපයෝගිතාව වන්නට ඇත්තේ පිරිත් පාඨ භාවිතයෙන් ලෙඩ රෝග සුවකර ගැනීමට උපදෙස් දීමයි. එමෙන් ම තම ආරක්ෂාවට හා වෙනත් අවශ්‍යතාවන් සඳහා කෙම්ක්‍රම ප්‍රගුණ කිරීමයි. පිරුවානා පොත් වහන්සේ සූත්‍ර ගණනාවක් ඇති තරමක් ලොකු පොතක් වන්නේ ය. එයින් තෝරාගත් සූත්‍ර කීපයක් ඇතුළත් කොට 'පිරිත් සන්නය' නැමැති  මේ පිටපත සකසා ඇත්තේ බහුවිධ උපයෝගිතාවන් සපුරාගැනීම සඳහාය. 'සන්න' ලිවීම මහනුවර සමයේ ජනප්‍රියව පැවැති බවට සාධක පවතී. උක්ත මේ පැරණි පිටපත වසර සියයක් පමණ පිටපතක් විය හැකිය. යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් සහ කෙම් ක්‍රම භාවිතයෙන් කටයුතු කළ කෙනෙකු විසින් පරිහරණ කරනු ලැබූ පිටපතක් බව ද විශ්වාස කළ හැකි ය. පුස්කොළපොත් පිටපත් අතරේ මෙබඳු පිටපත් දුර්ලභ වෙයි. ලාංකේය පුස්කොළපොත් නාමාවලිය (කේ. ඩී. සෝමදාස. 1959) තුළ පුස්කොළ පොත් පිටපත් දහස් ගණනක නම් ඇත. එහෙත් පිරිත් සන්නය නමැති නාමයක් සහිත පිටපත් එහි අන්තර්ගතව නැත.

පූජ්‍ය මාපලගම මෙත්තෙය්‍ය හිමි විසින් සම්පාදනය කරනු ලැබ ඇති 'පිරිතේ බලය හා ගත හැකි ප්‍රයෝජන' (සදීපා ප්‍රකාශන, 2006) කෘතියෙන් පිරිත් බලයෙන් කෙම්ක්‍රම හා ආරක්ෂක විධි කීපයක්ම හඳුන්වා දෙයි.

මවිසින් ඉදිරිපත් කරන ලද පුස්කොළ පිටපතේ සඳහන් ඇතැම් කරුණු ද එහි සඳහන් වෙයි. මෙත්තෙය්‍ය හිමි  ප්‍රකාශයට පත්කර ඇති කෘතිය සඳහා තොරතුරු ලබාගත් මූලාශ්‍රයක් සඳහන් නො වෙයි. ඇතැම්විට අපට ලැබුණ පිටපතට සමාන ආකාරයේ පිටපතක් උන්වහන්සේ භාවිත කළේ ද යනු නො දනී. කෙසේ නමුත් පූජ්‍ය මාපලගම මෙත්තෙය්‍ය හිමියන්ගේ කෘතිය බෙහෙවින් වැදගත් ය. මේ ආකාර ප්‍රකාශන මගින් ද ඉහත සඳහන් පුස්කොළ



පිටපත හා සමාන තවත් එම ක්ෂේත්‍රයේ පිටපත් ද පුරාතනයේ භාවිත වන්නට ඇත. මේවා සොයා ප්‍රකාශනයට පත්කිරීම කාලෝචිත ය. ඉන් සම්ප්‍රදායික කෙම් ක්‍රම සහ ආරක්ෂක විධික්‍රම නැවත සමාජගත වෙයි. සියල්ලම රසායනික බෙහෙත් ආදිකොට ඇති භෞතික ප්‍රතිකර්මවලට භාර නොදී ගුප්ත ක්‍රම මගින් ප්‍රතිකාර සහ සෙත් සාන්ති ඇතිකර ගැනීමට පෙලඹීම යෙහෙකි. ම විසින් දක්වන ලද පුස්කොළ පිටපතට අතිරේකව පූජ්‍ය මාපලගම මෙත්තෙය්‍ය හිමියන්ගේ පිරිතේ බලය හා ගතහැකි ප්‍රයෝජන කෘතියෙන් උපුටාගත් තොරතුරු ප්‍රමාණයක් ද මෙහි අන්තර්ගත කරනුයේ උන්වහන්සේට ගෞරව ස්තුති පුදකරමින් ය. උපුටාගනු ලබන විස්තර මෙසේ ය.

**ඒවං මේ සුතං ඒකං සමයං භගවා...**

මෙම ගාථාවෙන් 108 වර තෙල් වලට මතුරා හිස ගානු. උණ, කැක්කුම් පහවී යයි.

**බාහු සච්චඤ්ඤ සිප්පඤ්ඤ ච...**

**මාතා පිතු උපට්ඨානං...**

යන ගාථා දෙක 108 වරක් දෙහි අත්තේක් හිස සිට දෙ පතුල දක්වා මතුරනු. සර්ප විෂ බහී. බල්ලන් කෑවාටද මතුරනු.

**දානං ච ධම්ම චරියා ච...**

**ආරති විරති පාපා...**

**ගාරවෝ ච නිවාතෝ ච...**

යන ගාථාවන් පුස්කොළයක හෝ තඹ තහඩුවක හෝ ලියා 108 වරක් හෝ 1000 වරක් හෝ මතුරා අත තබාගෙන යනු. තමන් හිතා ගත තියෙන කරුණු සියල්ලම ඉටුවේ. නඩු හබවලින් ද යුක්තිය දිනයි.

**ඛන්ති ච සෝවචස්සතා...**

**පුට්ඨස්ස ලෝක ධම්මේහි...**

**ඒතා දිසානි කත්වාන...**

යක්ෂ භය, ප්‍රේත භය, අමනුෂ්‍ය භය ආදියෙන් පෙළෙන ගෘහයන්වල උදේ සවස පිරිත් කරනු. ඔවුන්ගෙන් වන කරදර මග හැරේ. අබ හා වැලි ගෙන මෙහින් 108 වර මතුරා ගේ තුළ ඉසිනු. දොළකින් හෝ වෙනත් පිරිසිදු තැනකින් නොපෑගුණ ගල් ගෙන මතුරා ගෙයි මුළු හතරේ වලලනු. අමනුෂ්‍යාදීන්ගෙන් පැමිණෙන ව්‍යසන මග හැරේ.

**යානීධ භූතානි සමාගතානි...**

**තස්මාහි භූතා නිසාමේථ සබ්බේ...**

තමන් පිරිසිදුව සිට මෙම ගාථා දෙකින් 108 වරක් බෝ පත්‍රයට ජීවන් කොට ඉණ තබාගෙන ගමන් යනු. යන ගමන් බිමන් සාර්ථක වේ.

**යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා...**

පළමුව බුදුරජාණන් වහන්සේට විළඳ පුදා කුල දෙවියන්ට කිරිබත් පුදා මුහුදින් හෝ ගඟකින් නොපාගන ලද වැලි ගෙන 108 වර මතුරා තම වාසස්ථානයෙහි ඉසුවොත් යක්ෂයින්ගෙන්, ප්‍රේතයින් ගෙන්වන කරදර නො පැමිණේත්. තමන් හට පැමිණෙන සියලු භය දුරුවේ. විපත්තියක් කරදරයක් වන මාර්ගයක යන්නේ නම් තුන්පුරුකක් ඇති ඊතණ ගසක් තබාගෙන ඊට මෙම ගාථාවෙන් 108 වරක් මතුරා හිස පැළඳ ගෙන යනු. භය දුරුවේ. ගෝරෝචන ගෙන රෙදි කඩක ඔතා එයට ඉහත සඳහන් ගාථාවෙන් 7වරක් මතුරා එයින් තිලක දී රජුන් ආදි උත්තමයන් දකින්ට යනු. තමන් සිතූ සියලු කරුණු සිද්ධවේ. ඉටුවේ. ප්‍රත්‍යක්ෂයි. කුඩා ළමයින් හඬන විට පිරිසිදු අළුවලට 108 වර මතුරා තිලක දෙනු. හැඬීම නතර වේ.

**ඛයං විරාගං අමතං පණීතං...**

පස් පවින් වැළකී තෙරුවන් පුදා ඉහත සඳහන් ගාථාවෙන් 108 වර මතුරා භය ඇති අය දකිනු. භය නැතිවේ. සර්ප උපද්‍රව නැතිවේ. සර්පයින් දෂ්ට කළ විට "සර්වවිෂාදි" හෝ වෙනත් තෙලකට 108 වර මතුරා ඇඟ ගානු. විෂ බසී. සත් විටක් අතට මතුරා සර්පයා කෑ තැන සිට පහළට අත ගානු. විෂ හැරේ. හිස කැක්කුම්වලට ද තෙල් මතුරා දෙනු.



**යම්බුද්ධසෙට්ඨෝ පරිවණ්ණයී සුචිං...**

මෙම ගාථාවෙන් 108 වරක් සමන් මලට මතුරා ගව ගාලට දමනු. සොරු නොගනිත්. මෙම ගයින් සමන් මලට 108 වර මතුරා ජලයට දමා ගවයන් නාවනු. ගවයින්ගේ බෝවීම වැඩි වෙත්. ලෙඩ රෝග පහවී යයි.

**යේ පුග්ගලා අට්ඨ සතං පසත්ථා...**

පස් පවින් වැළකී මෙම ගාථාවෙන් 108 වර මතුරා ඇඟ අතගානු. ලක්ෂණ වේ. භය දුරුවේ. සතුරන්ගෙන් කරදර ආදිය නො පැමිණෙත්. යුක්ති සහගතව කතා කරණ විට මෙය සිහි කරනු.

**යේ සුප්පයුත්තා මනසා දළ්හේන...**

බුදුන් වැඳ පන්සිල් ගෙන පිරිසිදුව සිට මෙම ගාථාවෙන් සහල් ගැරූ තැනින් ගල් 7ක් ගෙන එක එක ගලට 7වර බැගින් මතුරා ගෙයි සතර කොනේ ද, ගේ මැද ද, ඉස්සරහ දොර පාමුල ද තබනු. තමා කළ දෙය අනුන්ට දැනගත නොහැක. අනුන් හා නඩු මගට බසින විට කාඩි සැල තිබුනු තැනින් ගලක් ගෙන සුවඳ වතුරෙන් නාවා මෙම ගාථාවෙන් 108 වර මතුරා ඉණ රුවා දකුණු පය පෙරට තබා යනු. දිනුම අත්වෙයි.

කුරුම්ණියන් කෑ ගොප්කොළයක් ගෙන පේ කොට තබා මෙම ගාථාව එහි ලියා එයට 108 වර මතුරා පස්පවින් හා දස අකුසලෙන් වෙන් වී සිටිනු. මරු සැර හා වෙනත් ආපදාවන්, කරදර ආදිය නොපැමිණෙත්.

**යථින්දඛිලෝ පඨවිංසිතෝ සියා...**

මෙයින් සමන් පිච්ච මල් වලට මතුරා චෛත්‍යයට හෝ බුදු ගෙයට පිදුවොත් තමන්ව දෙවියෝ ආරක්ෂා කර ගනිත්. සතුරන්ගෙන් පැමිණෙන කරදර නවතිත්. තලතෙල්වලට 108 වර මතුරා වේදනා, කැක්කුම් ඇති තැන්වල අතුල්වනු. එවෙලේම වේදනා කැක්කුම් පහ වී යත්.

**යෙ අරියසච්චානි විභාවයන්ති...**

මෙම ගාථාවෙන් මී තෙල්වලට 108 වර මතුරා ඇඟේ ගානු. ශ්‍රීයා ඇතිවේ. යක්ෂ, ප්‍රේත, කුම්භාණ්ඩ, පිසාච, අමනුෂ්‍ය දෝෂ හා භය ආදි සියල්ල නසිත්. තමාහට නපුරක් ඇති කල මෙම ගාථාවෙන් 108වර ගෝරෝචන හෝ රත්හඳුන්වලට මතුරා චෛත්‍යයට පූජා කරනු. කරදර කම්කටොලු වලින් මිදේ.

**සභාවස්සදස්සනසම්පදාය...**

මෙම ගාථාවෙන් බුලත්වලට 108 මතුරා බුදුරදුන්ට මල් පහන් පුදා කුල දෙවියන්ට පහන් තබා ඉෂ්ටාර්ථ සිද්ධිය පිණිස යනු. සියලු ගමන් ශුභවේ. තැඹිලි ගසක් යට ශුද්ධපවිත්‍ර කොට එයට පිට තබාගෙන ඉහත ගාථාවෙන් 108 වර මතුරා එම ගසේ මලින් කොටසක් පලඳිනු. ගිනිසැර නොවදී. සතුරෝ මෙල්ල වෙත්.

කෙනෙක් තමන්ට විරුද්ධ කේලාම් කියත් නම් සඳුන් කැබැල්ලක් ගෙන එයට අටතුරාසියල් මතුරා මහා සෑයට පුදනු. කේලාම් කීම් නවතිත්.

**කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං...**

පඤ්ච වර්ණ බත්පිඬු ගෙන මෙම ගාථාවෙන් 108 මතුරා බත් පිඬු වෙන වෙන ම ගෙන හෙළ කොළ උඩ තබනු. සතුරු බිය දුරු වෙත්. මෙම ගාථවෙන් 108වර ධාන්‍යවලට මතුරා කුඹුරේ ඉසිනු. ධාන්‍ය හානිය වලකිත්. මෙම ගාථාව ගොප්කොළවල ලියා කුඹුරේ සතර වටේ එල්ලනු. ඌරන්ගෙන් හා වෙනත් සතුන්ගේන් වන හානි වැළකේ.

මෙම ගාථව බෙර ඇසේ ලියා මෙයින් මතුරා කයිල වැලක් ගෙන බෙර ගසනු. ශබ්දය ඇසුන මානය තෙක් ගොයම් මැස්සෝ නො එත්. මෙය පස් පවින් වැළකී සිදු කරනු. එදින එම ක්‍රියාවෙන් පසු බාහිර මිනිසුන් හට වසන් වී සිටිය යුතු ය. මෙම ගාථාවෙන් 21වර ගලට මතුරා ඉණ තබාගෙන කිඹුලන් සිටින තැනින් යනු. ඔවුන්ගෙන් උවදුරක් නොපැමිණෙත්. මෙම ගාථාවෙන්



බෙහෙත්වලට හා කසායට මතුරා ලෙඩාට දෙනු. ඉක්මන් සුවය ලැබේ. සියලු ආරක්ෂාවලට ද මෙම ගාථාව සිහි කරනු. සොර සතුරන්ගෙන් ද උපද්‍රවයක් නොවෙත්. සැක නොකරනු.

**වනප්පගුබ්බේ යථා ඵුස්සිතග්ගේ...**

මෙම ගාථාවෙන් 108 වර පිරිසිදු පැන්වලට මතුරා ප්‍රසව වේදනා ඇක කල පොවනු. නිරුපද්‍රිතව දරුවා බිහිවෙයි. මෙම ගයින් ධාන්‍යවලට 108වර මතුරා වපුරනු. ශස්‍ය අධික් වෙත්. තෙල් වලට 108වර මතුරා පහන් පත්තු කරනු. ආරක්ෂාව සිද්ධ වේ. අමනුෂ්‍ය දෝෂ දුරුවෙත්. බෙහෙත් දෙන විට මෙම ගයින් මතුරා දෙනු. ඉක්මන් සුවය අත්වේ.

**වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ...**

ඉපියන්ගෙන් හා මීයන්ගෙන් කුඹුරට වන හානි වැළැක්වීමට පිණිස ඉහත සඳහන් ගාථාවෙන් පිරිසිදු පැන්වලට මතුරා කුඹුරේ ඉසිනු. වීවලට 108වර මතුරා කුඹුරේ ඉසිනු. ධාන්‍ය වැඩි වෙත්. දරුවා නාවන වතුරට මතුරා නාවනු. අපල, උපද්‍රව, ඇස්වහ, කටවහ, දුරුවෙත්. සමන් පිච්ච මලට මතුරා හිස පැළඳ රජුන්, ප්‍රභූන් දකිනු. කරුණාව ලබයි. තැඹිලි තෙල්වලට 108වර මතුරා ගා ගෙන යනු. නඩු දිනත්, සිරුරේ ගඩු බිබිලි හටගත් විට අතට 108වර මතුරා ඇග ගානු. සුවවේ. සමන් මලට මතුරා හිසෙහි ගසාගෙන රජුන් දකිනු. රජු වසඟ වේ.

**ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං...**

මෙම ගාථාවෙන් 108 වර තෙල්වලට මතුරා ගෙය තුළ ඉසිනු. උපද්‍රාදිය දුරුවෙත්. මතුර හරක් ගාලට ඉසිනු. සතුන්ට වැළඳෙන රෝග දුරුවෙත්. දරුවන්ට රංකිරි කට ගෑමේ දී කිරට මතුරනු. ඉඳුල් කටගෑමේ දී එයට මතුරනු. දරුවා හැම අතකින් ම ආරක්ෂා වේ. පිස්සු බල්ලන් කෑවාට 108වර මතුරා තෙල් ගානු.

**යානීධ භූතානි සමාගතානි...**
යානීධ භූතානි - පෙ - ධම්මං නමස්සාම සුවත්ථි හෝතු
යානීධ භූතානි - පෙ - සංඝං නමස්සාම සුවත්ථි හෝතු

මී මැස්මුර සෑදුණු අයට තැඹිලි වතුරට 108 වර මතුරා දෙනු. සතියක් නොකඩවා එසේ කරනු. තමන්හට පැමිණෙන භය චකිතයන්වල දී මෙම ගාථාව නිතර භාවිත කරනු.

**කරණීයමත්ථ කුසලේන...**

**සන්තුස්සකෝ ච සුභරෝච...**

**නච බුද්දං සමාචරේ කිඤ්චි...**

යන ගාථා තුනෙන් අටු කොටු හා ගෙයි වෙනත් දෙවල් මීයන් කනවාට මෙම ගාථාව තලකොළ කැබලි දෙකක ලියා දෙකොනේ තබනු. උඳු ගොව්වන් කනවාට මීතෙල්වලට මතුරා කෑ තැන්වලවල ගානු. මෙය කීප දිනක් කළ යුතු ය.

යේ කේචි පාණභූතත්ථි...

දිට්ඨා වා යේව අද්දිට්ඨා...

මෙම ගාථා දෙක තල්පතක ලියා කුඹුරේ එල්ලනු. ගොයම් මැස්සන්ගෙන් කුඹුර ආරක්ෂා වෙත්. නො පැමිණේත්.

**මාතා යථා නියං පුත්තං...**

**මෙත්තං ච සබ්බ ලෝකස්මිං...**

**තිට්ඨං චරං නිසින්නෝ වා...**

මෙම ගාථා තුනේ මුලකුරු තුන බුලත් කොළයක ලියා එය 108 වරක් මෙම ගාථා තුනෙන් මතුරා ගර්භනී මාතාවට කන්ට දෙනු. දරු ප්‍රසූතිය පහසු කෙරේ.

**දිට්ඨීඤ්ච අනුපගම්ම සීලවා...**

මෙම ගාථාවෙන් නො පැගුණ ගල්වලට මතුරා ගව පට්ටියේ වළලනු. අතුරු අන්ත්‍රා නොවී ගවයෝ වැඩෙත්. බෝවෙත්. කමතේ මැද කනුව යට ගල් මතුරා යට කරනු. අස්වැන්න වැඩිවෙන් ලැබෙත්.

## නිගමනය

බෞද්ධයෝ ආරක්ෂාව සඳහා සහ සෙත් ශාන්තිය මෙන්ම සමාජය සුඛිත මුදිත කරගැනීම සඳහා පිරිත් ආශ්‍රයකර ගන්නා



බව ප්‍රකටය. පිරිත් බලයෙන් කෙම් ක්‍රම හෝ අභිචාරවිධි පවත්වනු ලැබ ඇත්තේද සුවිශේෂී බලාපොරොත්තු උදෙසා විය හැකිය. රසායනික ඖෂධ මගින් අද පිරිමසා ගැනීමට උත්සහා කරනු ලබන ඇතැම් උපයෝගිතාවන් පිරිත් බලයෙන් සපුරා ගත හැකි බව අපේක්ෂා කළ හැකිය. මේවා ශාරීරික හා මානසික පීඩා මෙන්ම කෘෂිකාර්මික සමාජ අවශ්‍යතා සඳහාද යෝග්‍යවනු නො අනුමානය. වර්තමානයේ වුවද මෙකී කෙම් ක්‍රම භාවිතයෙන් අදාළ සමාජීය අවැසියාවන් සපුරාගැනීමට හැකි බව නිගමනය කරමු.

පැරුන්නෝ මන්ත්‍ර සමග පිරිත් භාවිත කළ බව පැරණි පුස්කොළ පිටපතකට අනුව මෙසේ දැක්විය හැකි ය.

"ගෙන්නා මල බුලතුත් සදවාලා
ගෙන්නා රත්මල් පඬුරු පුදාලා
කන්න්‍යා නූලෙන් වටකර ඇදලා

දන්නා මන්තර <u>පිරිත්</u> දපාලා

(පිහිඹියගොල්ලෑවේ කරුණාරත්න මහතාගේ පුස්කොළ මිශ්‍ර වෙදපොත, 22 පත් ඉරුව මුල් පැත්ත).

## ආශ්‍රිත ග්‍රන්ථ


1. කහඳගමගේ, පියසේන. **කෙතක මහිම : කුඹුර**, එස්. ගොඩගේ (1997) කොළඹ.
2. කහඳගමගේ, පියසේන. **කෙතක මහිම : කෙම්පහන්**, ඇස්. ගොඩගේ (1995) කොළඹ.
3. **බුද්දකනිකාය**. බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, පුනර් මුද්‍රණය (2005) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.
4. ගමගේ ගැමුණුසිරි, **පිරිතෙහි පරිණාමය**, ඇස්. ගොඩගේ (2009) කොළඹ.
5. දනන්සූරිය, ජිනදාස, ජනශ්‍රැති අධ්‍යයන, එස්. ගොඩගේ (2001) කොළඹ.
6. අදාළ පුස්කොළ පිටපත.

7. පරමත්ථජෝතිකා නැම බුද්දකපාඨට්ඨකථා, හේවාවිතාරණ මුද්‍රණ (1929) පානදුර.

8. පාළි සිංහල පිරිත්පොත. පම්පාදක කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර හිමි. ඇස්. ගොඩගේ (2002) කොළඹ.

9. පිරුවානා පොත් වහන්සේ. සම්පාදක අත්තුඩාවේ රාහුල හිමි. සමයවර්ධන (1994) මරදාන.

10. පිරුවානා පොත් වහන්සේ නම් යුත් මහපිරිත් පොත. සැකසුම. මකුළුදූවේ ශ්‍රී පියරත නා හිමි. ගුණසේන (2009) කොළඹ.

11. මෙත්තෙය්‍ය හිමි, මාපලගම. පිරිතේ බලය හා ගතහැකි ප්‍රයෝජන. සදීපා (2007) කොළඹ.

12. ශාසනික පරිත්‍රානවිධි. සම්පාදක. අතුරලියේ ඉන්දරතන හිමි (1984) පොල්හේන මහා විහාර සභාව, මාතර.

13. සර්පවෙද පොත. ජාතික කෞතුකාගාරය (1956) කොළඹ.

14. සාරත්‍ථසමුච්චය නාමා චතුභාණවාරට්ඨකථා. හේවාවිතාරන මුද්‍රණය (1929) පානදුර.

15. සාරාර්ථදීපනි : සතර බණවර සන්නය. සංස්කරණය. අත්තුඩාවේ රාහුල හිමි, සමයවර්ධන (2000) මරදාන.

16. රත්නපාල නන්දසේන. ජනශ්‍රැති විද්‍යාව. එස්. ගොඩගේ (2010) කොළඹ.

17. Spolia Zeylanica Vol. 36. Part 1.

18. *Paritta A Historical And Religious Sturdy Of The Buddhist Ceremony For Peace And Prosperity In Sri Lanka.* Lily De Silva. National Museums Of Sri Lanka 1981